## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - 2015

----------------------------------------------------

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

පොලී ලැබීම් හා පොලී ගෙවීම් වලින් වන මුදල් ප්‍රවාහයන් එකිනෙක වෙනම හෙළිදරව් කළ යුතු අතර ඒ එකිනෙක මෙහෙයුම්, ආයෝජන හෝ මූල්‍ය ක්‍රියාකාරකම් වශයෙන් කාලච්ඡේදයෙන් කාලච්ඡේදයට සංගත වන ආකාරයෙන් වර්ග කළ යුතුය. එසේ වුවද කාර්යාංශය විසින් පොළි ලැබීම් හා පොලී ගෙවීම් වලින් වන මුදල් ප්‍රවාහයන් වෙනම හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

අස්පෘශ්‍ය වත්කමක් වූ පරිගණක මෘදුකාංග පිරිවැය රු.1,592,770 ක් දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ දී මෝටර් රථ දෙකක් ප්‍රත්‍යාගණනය කර එම අගය ගිණුම්ගත කිරීමේදී ඇති වූ ගිණුම්කරණ දෝෂය සමාලෝචිත වර්ෂයේ දී නිවැරදි කිරීමට යාමේදී නැවතත් දෝෂ සහිතව ගිණුම්ගතකර තිබුණි. ඒ හේතුවෙන් මෝටර් රථ ගිණුම රු.2,100,000 කින් වැඩියෙන්ද සමුච්චිත ලාභ ගිණුම රු.1,600,000 කින් අඩුවෙන්ද, මෝටර් රථ ක්ෂය වෙන්කිරීමේ ගිණුම රු.3,300,000 කින් වැඩියෙන් හා වර්ෂයේ ක්ෂය රු.400,000 කින් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) ප්‍රවර්ධන කටයුතු සඳහා තානාපති කාර්යාලය වෙත ප්‍රේෂණය කරන ලද මුදලින් වර්ෂය අවසානයේ ඉතිරිව ඇති රු.33,647,581 ක ශේෂයක් අවසන් ගිණුම් වල ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණි.

(ඇ) ජාත්‍යන්තර ඉන්දියානු සිනමා උළෙල වෙනුවෙන් මිලදී ගන්නා ලද රු.196,800 ක් වටිනා පරිගණක උපාංග ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු. 7,449,005 ක් වූ ලැබිය යුතු ශේෂ 04 ක් සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවීය.

2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ශේෂය රු.14,600,904 ක් වුවත් සංචාරක සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල කාර්යාංශයෙන් ලැබිය යුතු ශේෂය රු.13,559,157 ක් වූ බැවින් වෙනස රු. 1,041,747 ක් විය.

2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ශේෂවලින් රු.2,448,920 ක් වර්ෂ 5කට වැඩි කාලයක්ද, රු.1,235,000 ක් වර්ෂ 03කට වැඩි වර්ෂ 05කට අඩු කාලයක් ද, රු.2,105,725 ක් වර්ෂ 01කට වැඩි වර්ෂ 03කට අඩු කාලයක් ද සහ රු.791,396,409 ක් වර්ෂ 1කට අඩු කාලයක් ද සහිත හිඟ ශේෂවලින් සමන්විත වී තිබුණි.

(ආ) තානාපති කාර්යාල වෙත ප්‍රේෂණය කරන ලද මුදලින් චීන තානාපති කාර්යාලයෙන් අයවිය යුතු වර්ෂ 03ට වැඩි ණයගැති ශේෂය රු.19,731,593 ක් වූ අතර අනිකුත් තානාපති කාර්යාලවලින් වර්ෂ 01 ට අඩු අයවිය යුතු ණයගැති ශේෂය රු.23,785,475 ක් විය.

(ඇ) ගෙවිය යුතු ශේෂවලින් රු.48,000 ක් වර්ෂ 05කට වැඩි කාලයක්ද, රු.1,229,280 ක් වර්ෂ 04 කට වැඩි කාලයක්ද රු. 6,607,680 ක් වර්ෂ තුනකට වැඩි කාලයක් ද රු. 921,367 ක් වර්ෂ 01ට වැඩි කාලයක් සහ රු.5,794,577 ක් වර්ෂ 01 කට අඩු කාලයක්ද සහිත ශේෂ වලින් සමන්විත වී තිබුණි.

(ඈ) වර්ෂ 05 කට වැඩි කාලයක සිට ගිණුම් වල අත්තිකාරම් ලෙස දක්වා ඇති රු.1,575,000 ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනය වනවිටත් නිරවුල් කර නොතිබුණි.

(ඉ) කාර්යාංශය වෙත ලැබී තිබුණු රු.50,000 ක අගරු චෙක්පතක් ලැබිය යුතු ශේෂයක් වශයෙන් නොදක්වා මුදල් හා මුදල් හා සමාන වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උප වගන්තිය | සෑම ලිත් වර්ෂයක් අවසානවී මාස තුනක් ඉකුත් වීමට පෙරාතුව එම වර්ෂය තුළ කාර්යාංශයේ වැඩ පිළිබඳ වාර්තාවක්, ලිත් වර්ෂයේ මාස හතක් අවසාන වීමට පෙරාතුව අර්ධ වාර්ෂික ගිණුම්, කාර්යාංශය ඉටු කර ගැනීමට අපේක්ෂා කරන ඉදිරි අවුරුදු 03 ක කාලසීමාවකට අපේක්ෂිත සැලැස්මක් සහ පූර්ව වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද සැලසුම් සම්බන්ධයෙන් වූ කාර්යසාධනය සහ ඉෂ්ඨ කර ගැනීම ඇතුලත් ප්‍රකාශයන් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 10 වගන්තියේ 5 උපවගන්තිය | සමාලෝචිත වර්ෂයේ රු.906,783,522 ක අතිරික්තයක් ලැබී තිබුණු අතර මුදල් පනතේ විධිවිධානවල සඳහන් මුදල් යෙදවීමෙන් පසු වර්ෂයේ ශුද්ධ අතිරික්ත ආදායමින් ඉතිරි සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට මාරුකිරීමට කටයුතුකර නොතිබුණි. |
| (ඇ) 2014 මාර්තු 04 දිනැති අංක MM1/1/160/(vii) දරන ජනමාධ්‍ය හා ප්‍රචෘත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය | ප්‍රවර්ධන කටයුතු සිදුකරන ජාත්‍යන්තරව පිළිගත් ආයතනවලින් රූපවාහිනී වැඩසටහන් සඳහා වන යෝජනා කැඳවීමට අධිකාරිය ලබාදී තිබුණද එසේ යෝජනා කැඳවීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත ඇස්තමේන්තු වටිනාකම රු.50,000,000 වෙනුවෙන් ආයතන දෙකක් තෝරාගෙන තිබුණි. |
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. 9.14.2 වගන්තිය | මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් වන සියළුම කාරණා පිළිබඳව පනවනු ලබන රීති සහ රෙගුලාසි අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර භාණ්ඩාගාර ලේකම්ගේ එකඟත්වය ගත යුතු වුවද, කාර්යාංශය මෙම අවශ්‍යතාවයට අනුකූලවීමට අසමත් වී තිබුණි. |
| (ඉ) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වටිනාකම රු.2,000,000 ඉක්මවන රාජ්‍ය ආයතන හා රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා කරන අනුග්‍රාහක වියදම් හෝ පරිත්‍යාග සඳහා හා ඉන් බාහිරව ගෙවනු ලබන රු.100,000 ඉක්මවන අනුග්‍රහක වියදම් හෝ පරිත්‍යාග සඳහා මුදල් ඇමතිතුමාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් 2015 වර්ෂයේදී එවැනි අනුමැතියකින් තොරව අනුග්‍රහක වියදම් සහ පරිත්‍යාග සඳහා රු.41,767,500 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.1,406,783,523 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.526,471,234 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.880,312,289 ක වර්ධනයක් දැක්වුණි. වෙළඳ කටයුතු සම්බන්ධ වියදම් රු.749,052,169 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී රු.658,411,571 ක අතිරික්තය උච්චාවචනයන් සහිතව 2015 වර්ෂය අවසානයට රු.906,783,522 ක් ලෙස වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේ දී 2011 වර්ෂයේ දායකත්වය රු.688,511,162 ක් වූ අතර 2015 වර්ෂයේ දී රු. 1,475,892,784 දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 කාර්යාංශයට එරෙහිව ආරම්භකර ඇති නෛතික සිද්ධි

ජාත්‍යන්තර ඉන්දියානු සිනමා සම්මාන උළෙල සම්බන්ධව රු.83,899,947 ක ගෙවීම් ලබාදෙන ලෙස කාර්යාංශයට එරෙහිව ගොනුකර තිබුණ නඩු 03 ක් හා බාහිර පාර්ශවයන් දෙකක් කාර්යාංශයට එරෙහිව ගොනුකර තිබුණු නඩු 02 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නොවිසඳී තිබුණි.

3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ දෙකකට අදාළව ගණනය කරන ලද කාරක ප්‍රාග්ධන අනුපාත අනුව ඉහල ද්‍රවශීලතාවයක් පවතින බව නිරීක්ෂණය වූ අතර අඛණ්ඩව කෙටිකාලීන ආයෝජන වල මුදල් යොදවා තිබීම මෙයට හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

4.1 කාර්යසාධනය

----------------

(අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 40(4) වගන්තිය අනුව කාර්යාංශයේ පරමාර්ථ පහත පරිදි වේ.

(i) අධිකාරියේ උපදෙස් විමසා සංචාරක සංවර්ධන සැලැස්මට අනුකූලව විශිෂ්ඨ සංචාරක හා වාරිකා ගමනාන්තයක් ලෙස ඍජුව හෝ වක්‍රව ශ්‍රී ලංකාව සංචාරක ක්ෂේත්‍රයේ අළෙවිකරණය සහ ප්‍රවර්ධනය;

(ii) දකුණු ආසියා කලාපයට දොරටුවක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම; සහ

(iii) කලාපයේ විශිෂ්ට සංචාරක කර්මාන්ත කළමනාකරණ හා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රකට භාවයට පත් කිරීම.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 797 ක වෙළෙඳ කටයුතු වියදමට සාපේක්ෂව පෙර වර්ෂයේදී එම වියදම රු.මිලියන 1,562 ක් වූයෙන් වියදම් අඩුවීම සියයට 49 ක් විය. එහෙත් සංචාරකයන්ගේ පැමිණීම 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 17.7 ක් වැඩි වී තිබුණි. එමෙන්ම සංචාරක කර්මාන්තයෙන් ශ්‍රී ලංකාව ලැබූ ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් බිලියන 0.549 ක් හෙවත් සියයට 22.58 ක් වැඩි වී තිබුණි.මේ අනුව වෙළඳ වියදම් වල අඩු වැඩිවීම සංචාරකයින්ගේ පැමිණීම හෝ ආදායම් වෙනස් වීමට ඍජුව බලපාන බව තහවුරු නොවුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර නර්තන සැණකෙළිය සඳහා අනුග්‍රාහක දායකත්වය ලබාදීම වෙනුවෙන් කාර්යාංශය විසින් පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ රු.1,500,000 ක අත්තිකාරම් ගෙවා තිබුණ ද අදාල සැණකෙළිය නොපැවැත්වීම හේතුවෙන් ගෙවූ අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) 2014 වර්ෂයේ දී රු.70,321,758 ක වියදමක් දරා පෞද්ගලික ආයතනයක් වෙතින් Global Television Campaign නමින් රූපවාහිනි වැඩසටහන් දෙකක් 2014 වර්ෂයේ නිර්මාණය කර තිබුණද අල් ජසීරා රූපවාහිනී සේවය ඔස්සේ එකී වැඩසටහන් විගණිත දිනය වූ 2017 මැයි 31 දක්වා ප්‍රචාරය වූ බව සනාථ නොවීය.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විදේශ රටවල සිදුකරන ප්‍රවර්ධන කටයුතු සඳහා තෝරාගත් ආයතනවලට රු.18,986,187 ක පෙර ගෙවීම් සිදුකර තිබුණත් ඒ සඳහා ලිඛිත ගිවිසුම් නොතිබුණු අතර බැංකු ඇපකර ලබාගෙන නොතිබුණි.

(ආ) එකතු වටිනාකම රු.3,506,757 ක වියදමක් දරා චීන මාධ්‍යවේදීන් 12 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණීය ප්‍රදේශ කිහිපයක් ආවරණය වන පරිදි සිදු කළ FAM චාරිකාව පිළිබඳ වාර්තා චීන මාධ්‍ය මඟින් ප්‍රචාරය කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීමෙන් චාරිකාව සඳහා දරන ලද වියදම ඵලදායී නොවන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 (ICC) ලෝක කුසලාන විස්සයි විස්ස ක්‍රිකට් තරඟාවලියේ ක්‍රිකට් පෝස්ටර් මුද්‍රණ සම්බන්ධ ප්‍රසම්පාදනයේ, ප්‍රසම්පාදන කමිටු තීරණය 2014 අප්‍රේල් 28 දින ලබා දී තිබුණද, ටෙන්ඩර් විවෘත කළ 2014 අප්‍රේල් 08 දිනදීම තාක්ෂණික ඇගයීම් කමිටුව රැස් වී තම වාර්තාව ලබා දීම, පෞද්ගලික ආයතනයකින් බඳු සමඟ රු. 700,000 ක ඉන්වොයිසිය ලැබීම සහ ක්‍රිකට් පෝස්ටර් සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙත ලැබීමට අදාල භාණ්ඩ භාර ගැනීමේ පත්‍රිකාව නිකුත් කිරීම නිසා මෙම කාර්යය විනිවිදභාවයකින් යුතුව සිදු වී තිබේද යන්න පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැක.

(ආ) විදේශ සංචාරක වෙළඳ ප්‍රවර්ධන කටයුතු සඳහා 2014 වර්ෂයේදී පෞද්ගලික ආයතනයකින් මිලදී ගන්නා ලද රු.1,342,096 ක් වටිනා ප්‍රවර්ධන භාණ්ඩ බෙදාහරින ලද ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොකළ අතර එකී භාණ්ඩ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා නියමයන් සඳහා වූ යොමුවට (Terms of Reference) අනුව කටයුතු කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.5 දෘෂ්‍ය අක්‍රමිකතා

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රුසියාවේ මොස්කව් නුවර පැවති සංචාරක ප්‍රවර්ධන වැඩසටහන (Leisure Travel and Tourism fair – 2014) සඳහා ටීෂර්ට් මිල දී ගැනීම වෙනුවෙන් රු.7,800,000 ක් වැය කර තිබූ නමුත් එකී ටීෂර්ට් තොග ආයතනය වෙත ලැබී නොතිබූ අතර එකී මිලදී ගැනීම් වෙනුවෙන් පිළියෙල කළ ලේඛන පිළිගත නොහැකි විය.

(ආ) පිළිගත් ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව 2010 වර්ෂයේදී ජාත්‍යන්තර ඉන්දියානු සිනමා උළෙල (IIFA) වෙනුවෙන් රු.1,116,000 ක් වැයකර මිලදී ගන්නා ලද ලැප්ටොප් පරිගණක 07 ක් හා ඩෙස්ක්ටොප් පරිගණක 03 ක් ගබඩාවට භාරගත් බවට හෝ නිළධාරීන් අතර බෙදාහැරි බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකළ අතර ඒවා භෞතික පරීක්ෂාවටද ඉදිරිපත් නොකෙරුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
-----------------------------------------

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත්කර තිබුණේ 2016 අප්‍රේල් 04 දිනදීය.

5.2 ක්‍රියාකාරී සැලැස්ම
----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද එම ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් ද හඳුන්වා දී නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය
-----------------------

අභ්‍යන්තර විගණන කාර්යභාරය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පවරා තිබුණ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5.4 විගණන කමිටු
-----------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව කාලානුරූපීව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මාස තුනකට වරක් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාලව විගණන කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම් විෂයයන් 28 ක අයවැයගත සංඛ්‍යා තථ්‍ය සංඛ්‍යා සමග සැසඳීමේදී සියයට 32 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.6 ප්‍රසම්පාදන සැලැස්ම
-----------------------

2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛයේ පරිච්ඡේදයේ 4.2.1 (අ), (ආ) සහ (ඇ) වගන්තිය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වූ සවිස්තරාත්මක සැලැස්ම සමග අවම වශයෙන් වසර තුනක් ආවරණය වනසේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.7 නොවිසඳී ඇති විගණන ඡේද
-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 03 දින සිට 06 දක්වා එක්සත් රාජධානියේ පැවැත් වූ වෙළඳ ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව මිලදී ගන්නා ලද රු.350,000 ක් වටිනා මැණික් ගල් 02 ක් හා නොමිලේ කාර්යාංශය වෙත ලැබුණු මැණික් ගල් 02 ක් ගබඩා තොග පොත්වල ඇතුලත් කර නොතිබුණු අතර නොමිලයේ ලැබුණ මැණික් ගල් 02 හි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමද සිදු කර නොතිබුණි.මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පරීක්ෂණ වාර්තා අනුව කැරට් 1.4,1.6,1.63 හා 1.54 බර මැණික් 4 ක් කාර්යාංශයට ලැබී

තිබුණු බැවින් රු.350,000 කට මිලදීගත් මැණික් ගල් 02 ක බර කැරට් 5.6 ක් වූයෙන් ස්වර්ණාභරණ අධිකාරියේ පරීක්ෂණ වාර්තා හා ඉන්වොයිසියේ සඳහන් විස්තර අනුව මැණික් ගල් වල කැරට් බර නොසැසඳුනි.

(ආ) 2014 වර්ෂයේ ලෝක සංචාරක දිනය නිමිත්තෙන් යයි දක්වමින් රු.5,824,000 ක මුදලක් වැයකර මුද්‍රණය කර තිබූ ටීෂර්ට්, එකී සැපයුම් ආයතනයේ අධ්‍යක්ෂකගේ ප්‍රකාශය පරිදි මුද්‍රණය කර තිබුණේ දේශපාලන පක්ෂයක ප්‍රචාරක කටයුත්තක් ලෙසිනි.

(ඇ) සංචාරක ක්ෂේත්‍රය තුළ සමාජීය වගකීම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලික ආයතන දෙකකට රු.99,439,900 (බදු රහිත) ක මුදලක් ගෙවා තිබූ නමුත් එකී ගෙවීම් පිළිගත නොහැකි ගෙවීම් බවට නිරීක්ෂණය විය.

(ඈ) එක්සත් රාජධානියේ පැවැත්වූ වෙළෙඳ ප්‍රදර්ශනයේ " (WTM) (UK) 2014" වෙළඳ ප්‍රදර්ශන කුටිය ඉදි කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව ලබා දීමේදී මිල කැඳවුම් ලිපි විවෘත කලයුතු දිනට දින 04 කට කලින් විවෘත කිරීම, ටෙන්ඩර්කරු හෝ නියෝජිතයෙක් ටෙන්ඩර් ලිපි විවෘත කරන අවස්ථාවට සහභාගී නොවීම, කොන්ත්‍රාත්කරු බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලය සමඟ ගිවිසුමකට එළඹ එහි පිටපතක් ප්‍රවර්ධන කාර්යාංශය වෙත එවිය යුතු බවට උපදෙස් දී ඇතත් ඒ අනුව කටයුතු කර තිබුණු අතර සහ වෙළඳ ප්‍රදර්ශන කුටි සාර්ථකව ඉදිකළ බවට වගකිව යුතු නිලධාරියෙකුගේ සහතිකයක් නොමැතිව එම ඉදිකිරීම සඳහා කාර්යාංශය විසින් රු.17,803,508 ක ගෙවීමක් කාර්යාංශය සිදු කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්
-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන කේෂ්ත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ගිණුම් කරණය නොකිරීම, ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල අගය නිවැරදි ලෙස ගිණුම්ගත නොකිරීම සහ ලැබිය යුතු ගිණුම් නිවැරදිව ගිණුම්වලින් හෙළිදරව් නොකිරීම. |
| (ආ) අයවැය | අයවැය සහ තථ්‍ය වියදම්වල සැලකිය යුතු විචලනයක් පැවතීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | කාර්යය මණ්ඩලය පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඈ) ප්‍රසම්පාදනය | මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු නොකිරීම. |